# ශ්‍රී ලංකාව - බෙදී ගිය ජාතියක පිලිබිඹුව

සුනන්ද දේශප්‍රිය

අප රටෙහි ජනයා ජනවාර්ගික වශයෙන් බෙදී ඇත්තේ ආගම, භාෂාව, ඇඳුම් පැළඳුම්, කැම බීම, වාසභූමි යනාදියෙන් පමණක් යැයි සිතූ කාලයක් තිබුනි. නමුත් එම අවධිය විසිවසරක ජනවර්ගික යුද්ධය විසින් සහමුලින්ම අවසන් කරමින් ඇති බව දැන් පෙනෙන්නට තිබේ.

සෝෂල් ඉන්ඩිකේටර් නම් ජනමත සමීක්ෂන ආයතනයේ නොවැම්බර් වාර්තාව ඉදිරිපත් කරන දත්තයන් විමසා බලන විට පෙනෙන්නේ ජනමාධ්‍ය මගින් කැරෙන යුද්දය විසින් සිංහල දෙමළ සහ මුස්ලිම් යනාදී වශයෙන් එකිනෙකට වෙනස් සමාජ දේශපාලන මනස් අප රටෙහි පැළපදියම් වන ආකාරය යි.

ආරම්භයක් ලෙස පසුගිය සමයේ අප ජනසමාජ කැලඹූ යුද්ධ සිදුවීම් ගනනාවක් පිලිබඳව සිංහල දෙමළ මුස්ලිම් ප්‍රජාවන් කල්පනා කරන්නේ කෙසේදැයි මෙම ජනමත විචාරණය ඇසුරෙන් විමසා බලමු.

## පොතුවිල් ඝාතනය

2005 අග භාගයේ දී පොතුවිල්හි මුස්ලිම් ජාතිකයන් 10 දෙනෙකු මරා දැමීම මුස්ලිම් ප්‍රජාව අතර මහත් තිගැස්මක් ඇති කළ සිදුවීමක් විය. ආණ්ඩුව සහ සිංහල පුවත්පත් කියා සිටියේ මෙම ඝාතනයට වග කිව යුත්තේ එල්ටීටීඊ ය බවයි. නමුත් මුස්ලිම් නායකයින් එය එලෙසම පිලි ගත්තේ නැත.

මෙම ඝාතනයට වග කිව යුත්තේ එල්ටීටීඊ ය බව සිංහල ජනයා අතර සියයට 65.2ක් දැන් විශ්වාස කරති. කදුරට දෙමළ ජනයා අතර එම ප්‍රතිශතය 4.8 ක් තරම් පහළ ය. මුස්ලිම් ජනයා අතර ද ඇත්තේ 18.7ක පහළ පිලිගැනීමකි. සිංහල ජනයා අතර ස්ථිර අදහසක් නැති පිරිස සියයට 33කි. කදුරට දෙමළ ජනයා අතර එම ප්‍රතිශතය 61කි. මුස්ලිම් ජනයා අතර 56කි. සිංහල ජනයා අතර ඊට වගකිව යුත්තේ ආණ්ඩුව යැයි සිතන්නේ සියයට 0.9 කි කදුරට දෙමළ ජනයා අතර එම ප්‍රතිශතය 32.9 කි. මුස්ලිම් ජනයා අතර 25.3 කි.

තවත් එවැනි සිදුවීමක් බලමු.

## මූතූර් ඝාතනය

මාවිල්ආරු යුද සටන අවස්ථාවෙහි මූතූර්හි අන්තර් ජාතික සහන සේවාවක රැකියා කළ සේවකයින් 13 දෙනෙකු ඝාතනය කෙරුණි. ඉන් 12 දෙනෙකුම මුස්ලිම් ජාතිකයින් විය. මෙම ඝාතනය මෙරට මෙන්ම අන්තර් ජාතික වශයෙන් ද මහත් ආන්දෝලනයකට තුඩු දුන්නේ ය. එම අවස්ථාවෙහි ද ආණ්ඩුව සහ සිංහල ජනමාධ්‍ය එම ඝාතනය ද එල්ටීටීඊ ක්‍රියාවක් ලෙස හඳුන්වා දුන්නේ ය.

මෙම ඝාතනය අරභයා සිංහල ජනයාගෙන් බහුතරයක් එනම් සියයට 59.2ක් සිතන්නේ ඊට එල්ටීටීය වගකිව යුතු බව යි. එම ප්‍රතිශතය කඳුරට දෙමළ ජනයා අතර ඉහත් සිදුවීම අරභයා මෙන්ම සියයට 1.2ක් තරම් පහළ ය. මුස්ලිම් ජනයා අතර 18.7 කි. නිශ්චිත අදහසක් නැති පිරිස කඳුරට දෙමළ (53.1) සහ මුස්ලිම් ප්‍රජාව(64) අතර බහුතරය වෙති. ඊට ආණ්ඩුව වගකිවයුතු යැයි කඳුරට දෙමළ ජනයා අතර සියයට 44.4ක් ද මුස්ලිම් ජනා අතර 17.3ක් ද විශ්වාස කරන විට සිංහල ජනයා අතර එලෙස පිළිගන්නේ සියයට 1.1ක අතිශය සුළුතරයකි.

මෙම සිදුවීම් දෙක අරභයා මෙරට ජනවාර්ගික ප්‍රජාවන් සිතන ආකාරයෙහි මහත් වෙනසක් බැලූ බැල්මටම පෙනේ. මුස්ලිම් සහ කඳුරට දෙමළ ප්‍රජාව තීරණයකට බැස ගැනීමට තොරතුරු මද බව සිතති. සිංහල ප්‍රජාවෙහි බහුතරය ආණ්ඩුවේ සහ සිංහල ජනමාධ්‍යන්හි මතය එලෙසම පිළි ගනිති. ඇත්ත වශයෙන්ම නම් මෙම සිදුවීම් දෙකම අරභයා තීරණයකට බැසීමට තරම් විශ්වසනීය තොරතුරු මෙරට ජනයාට ලැබුනේ නැත. එම සිදුවීම් දැන් ඇත්තේ මානව හිමිකම් පරීක්ෂනයක් යටතේ ය.

මෙරට දෙමළ ජනයා අතර මෙම සමීක්ෂනය දෙමළ ජනයා අතර කෙරී නැත. ඒ යුද තත්ත්වයේ බලපෑම නිසා ය. මෙයට පෙර සිදු කෙරුණු සමීක්ෂනයන්ගෙන් පෙනී ගියේ එම ප්‍රජාවෙහි අදහස් බොහෝ කරුනු සම්බන්ධයෙන් යම් දුරකට කඳුරට දෙමළ ජනයාගේ අදහස් සමඟ සම්පාත වන බව යි.

## මානව හිමිකම් - වගකීම කාටද?

මෙම බෙදීම අත්තේ මෙම කරුනු දෙක අරභයා පමණක් නොවේ. කොළඹ දෙමළ පිරිස් අතුරුදහන්කිරීම් සම්බන්ධයෙන් ද ඇත්තේ එවැනිම වෙනස් අදහස් ය. සිංහල ජනයාගෙන් සියයට 41ක් සිතන්නේ ඊට වගකිව යුත්තේ එල්ටීටීඊ ය බව යි. කඳුරට දෙමළ ජනයා අතර සියයට 58.5ක් සිතන්නේ මෙම අතුරුදහන්වීම් වලට ආණ්ඩුව වගකිවයුතු බව යි. මුස්ලිම් ජනයා අතර සියයට 71.1ක් ම කියන්නේ ස්ථිරව යමක් කීමට බැරි බව යි.

පසුගිය කාලයෙහි සිදුවූ මානව හිමිකම් කෙලෙසීම් පිලිබඳ පරීක්ෂා කිරීමට ජාත්‍යන්තර සහභාගිත්වය අවශ්‍ය බව සිතන්නේ සිංහල ජනයා අතර සියයට 20ක් තරම් ය. කඳුරට දෙමළ ජනයා අතර එම ප්‍රතිශතය සියයට 42ක් තරම් ය. මුස්ලිම් ජනයා අතර සියයට 66ක් තරම් ය. කඳුරට දෙමළ ජනයා සහ සිංහල ජනයා අතර අදහසක් නැති අය බහුතරය වෙති.

මානව හිමිකම් රැකීමේ වගකීම ඇත්තේ ආණ්ඩුවටට බව ප්‍රජාවන් තුනෙහිම බහුතරය එකඟවන අතර එ උදෙසා ප්‍රමාණවත් තරම් ආණ්ඩුව කටයුතු කර ඇතැයි සිතන බහුතරය ඇත්තේ සිංහල ජනයා අතර පමණි. කඳුරට දෙමළ ජනයා අතර එම ප්‍රතිශතය සියයට 6.1ක් තරම් පහල ය.

උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක දෙක යළි වෙන් කිරීමට ඔක් 16 දා ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීරණය යහපත් බලපෑමක් කරනු ඇතැයි විශ්වාස කරන බහුතරය ඇත්තේ සිංහල ප්‍රජාව තුළ පමණ ය. එය විසින් අයහපත් බලපෑමක් ඇති කරනු ඇතැයි කඳුරට ජනයා අතර සියයට 82.8ක් ද මුස්ලිම් ජනයා අතර 51.9ක්ද විශ්වාස කරන අතර සිංහල ජනයා අතර එසේ සිතන්නේ සියයට 18.4ක් පමණි.

## ආණ්ඩුව එල්ටීටීඊ ය සහ කරුණා

ආණ්ඩුව සහ කරුණා කන්ඩායම අතර සම්බන්ධයක් ඇතැයි කල්පනා කරන්නේ සිංහල ජනයා අතර සියයට 18.4ක් පමණි. කඳුරට දෙමළ ජනයා අතර 52.6ක සහ මුස්ලිම් ජනයා අතර 33.8ක ප්‍රතිශතයක් ද එසේ සිතති. එවැනි සම්බන්ධයක් නැතැයි කියන වැඩිම පිරිස වන 23.2ක් ඉන්නේ සිංහල ජනයා අතරය. කඳුරට දෙමළ ජනයා අතර එම පිරිස 00කි. මුස්ලිම් ජනයා අතර 3.9කි.

සාම සාකච්ජා සම්බන්ධයෙන් ආණ්ඩුව ඉතා අව්‍යාජ බව කල්පනා කරන බහුතරයක් ඇත්තේ සිංහල ප්‍රජාව තුළ පමණි. එය සියයට 66.8 කි. කඳුරට දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් තුල ඇත්තේ යම් දුරකට අව්‍යාජ බවට පිලිගැනීමකි.

සාම සාකච්ජා සම්බන්ධයෙන් එල්ටීටීඊ ය ඉතා අව්‍යාජ බව කල්පනා කරන්නේ මෙම ප්‍රජාවන් තුළ කුඩා සුලුතරයන් ය. නමුත් කඳුරට දෙමළ ප්‍රජාව සහ මුස්ලිම් ප්‍රජාව තුළ සියයට 50කට කිට්ටු ප්‍රතිශතයක් එල්ටීටීඊ ය එහිලා යම්දුරකට අව්‍යාජ බව විශ්වාස කරති.  සිංහල ප්‍රජාව තුළ එම ප්‍රතිශතය 4.6ක් තරම් වන අතර 78.8ක් තරම් විශාල බහුතරයක් එල්ටීටීයෙහි කිසිදු  අව්‍යාජ බවක් නැතැයි කල්පනා කරති.

## බාහිර මැදිහත්කරු අවශය ද?  කව්ද?

සාම ක්‍රියාවලියට ඉන්දියාව අවශ්‍ය ද යන ප්‍රශ්නය අරභයාද දක්නට ඇත්තේ පැහැදිලි බෙදීමකි. ඉන්දියනු මැදිහත්මක් විසින් මෙරට සාම ක්‍රියාවලායට සාධනීය බලපෑමක් ඇති කරනු ඇතැයි කල්පනා කරන සිංහල ප්‍රතිශතය 26.2ක් වන මුත් කදුට දෙමළ ජනයා අතර 73.8ක් ද මුස්ලිම් ජනයා අතර 53.3ක ද ප්‍රතිශතයක් එසේ කල්පනා කරති.

සාම ක්‍රියාවලියේ නොර්වීජියානු පහසුකම් සැළසීම සිංහලයින් සියයට 66.9ක් අනුමත කරන්නේ නැත. එනමුත් කදුරට දෙමළ ජනයා අතර සියයට 69ක් ද මුස්ලිම් ජනයා අතර සියයට 64.5ක් එම භූමිකාව අනුමත කරති.

එමෙන්ම ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම විසඳීමට ජාත්‍යන්තර මැදිහත් වීමක් අවශ්‍ය බව කල්පනා කරන සිංහල ප්‍රතිශතය 32.9ක්වන විට කදුරට දෙමළ ජනයා සහ මුස්ලිම් ජනයා අතර එම ප්‍රතිශතය 79ක් තරම් ඉහළ ය. ඉන් පෙනෙන්නේ කදුරට දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර සිංහළ ආණ්ඩුව සම්බන්ධයෙන් ඇති අවිශ්වාසය යි.

නොර්වීජියානුවන් සාම ක්‍රියාවලියේ පහසුකම් සළසන්නාගේ භූමිකාවෙන් ඉවත් කළ යුතු බවට ජවිපෙ ගෙනා යෝජනාවට පක්ෂපාතීත්වයේ ප්‍රතිශතය සිංහල ජනයා අතර 28.6ක් ද කදුරට දෙමළ ජනයා අතර 2.6ක් දමුස්ලිම් ජනයා අතර 16ක් ද වෙති. මුස්ලිම් ජනයා අතර 57.7ක ද කදුරට දෙමළ ජනයා අතර 48.7ක ද සිංහල ජනයා අතර 22.8ක ද ප්‍රතිශතයක් ඊට විරුද්ධ ය.

## සටන් විරාම ගිවිසුම සහ නිරීක්ෂනය

ශ්‍රී ලංකා සටන් විරාම ගිවිසුම සිය නිරීක්ෂනයන්හිදී අපක්ෂපාතී යැයි කල්පනා කරන්නේ සිංහලයින්ගෙන් සියයට 12.5ක් පමනි. කදුරට දෙමළ ජනයා අතර 70.7ක් ද මුස්ලිම් ජනයා අතර 51.9ක් ද තරම් විශාල ප්‍රමාණයක් එසේ විශ්වාස කරති. එමෙන්ම නිරීක්ෂන කමිටුවක් අත්‍යවශ නැතැයි කියන පිරිස සිංහලයින් අතර බහුතර කණ්ඩායම (44.8)වන විට කදුරට දෙමල ජනයා අතර 93.3ක් ද මුස්ලිම් ජනයා අතර 88.5ක්ද එසේ කියන්නේ නිරීක්ෂනය අත්‍යවශය යැයි කියාය.

සටන් විරාම ගිවිසුම සම්බන්ධයෙන් ද ඇත්තේ එවැනිම බෙදීමකි. සිංහලයින්ගෙන් සියයට 52.9ක් කියන්නේ ඉන් රටට වැඩක් නොවූ බවය. නමුත් කදුරට දෙමළ ජනයාගෙන් සියයට 68.9ක් ද මුස්ලිම් ජනයාගෙන් 87.3ක් ද කියන්නේ ඉන් රටට යහපතක් වූ බව යි.

## බෙදී ගිය ජාතිය

මේ සියලු සංඛ්‍යා දත්ත පෙන්නුම් කරන්නේ භයානක ලෙස ස්වකීය දේශපාලන අදහස් උදහස් සහ විශ්වාසයන් අතින් බෙදී යමින් සිටින ජනසමාජයකි. එකම සිදුවීම හෝ කියාවලිය අරභයා දක්නට ඇති මෙම වෙනස් වටහා ගැනීම් විසින් භූගෝලීය වශයෙන් කෙසේ වෙතත් සමාජී මනසින් දරුණු ලෙස බෙදී ගිය සමාජයක් පෙන්නුම් කරයි.

සමාජයක අදහස් උදහස් සැකසෙන්නේ ඔවුන් දකින අසන කියවන සහ ඒ අතරින් විශ්වාස කරන කරුණු කාරණා අනුව ය. අප සමාජයේ සිංහල දෙමළ මුස්ලිම් යන ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම්හි ජනමනස මෙතරම් දුරට බෙදී ගොස් ඇත්තේ ද ඒ අනුව විය යුතු ය.

මෙම බෙදීම මගින් පෙන්නුම් කරන්නේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ මතවාදී නායකත්වය සිංහල ජනයා අතර තහවුරු වී ඇති සැටි ය. යුද්දයේ ආණ්ඩුවේ මතවාදය සිංහල ජනමාධ්‍ය මගින්ද එලෙසම ප්‍රචාරය කැරෙන අතර එය පිළිගැනීමක් ලබා තිබේ. නමුත් දෙමළ සහ මුස්ලිම් ප්‍රජාව ආණ්ඩුවේ දේශපාලන ව්‍යාපෘතිය පිළි නොගන්නා බව පැහැදිලි ය.

එම ජන කණ්ඩායම් දෙකම සියයට සියයක් තරම් කල්පනා කරන්නේ සාම උදා කර ගැනීමේ මාවත සාම සාකච්ඡා බව ය. සිංහලයින් අතර එම ප්‍රතිශතය සියයට 57.8කි. නමුත් දැන් සියයට 25.4 ක සිංහලයින් පිරිසක් යුද්ධය මගින් එල්ටීටීඊ ය පරාජය කිරීම මගින් සාමය ඇති කළ හැකි යයි කියති. පසුගිය සමය පුරාම මෙම ප්‍රතිශතය තිබුනේ සියයට 7-8ක් තරම් පහල අගයක ය. මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ එක් "ජයග්‍රහණයක් " නම් මෙම යුදවාදී ජනමනස ඇති කර ගැනීම යි.

මෙයට අදාලව මෙම ප්‍රජාවන් තුනම එකඟ වන වැදගත් කරුණක් තිබේ. ඉන් එකක් නම් මහා යුද්ධය ආරම්භ වීමට දැන් හොඳටම ඉඩ ඇති බව යි.

( ජනමත සමීක්ෂණයන්ගෙන් ඉදිරිපත් කරන්නේ ප්‍රවණතා මිස සියයට සියයක නිවැරදි අනාවැකි නොවේ. සම්පූර්න වාර්තාව සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ www.cpalanka.org වෙබ් අඩවිය බලන්න)

නිමි.